

# 7. තුන් වන මරණය

එඬෙරා ගේ අට මස් දරුවෙක් වූයේ ය. බොහෝ විට මේ දරුවා බලා-ගන්නේ කිරි හාමි ය. මේ නිසා ඔහුට එඬෙර බිරින්දෑ ගෙන් ලැබුණු සැලැකිලි ඉතා මහත් ය.

දිනක් එඬෙර බිරින්දෑ දරුවා නැවූ දෑ ය. නාවා ඉවර වූ පසු ද දිය කොරහේ කෙළින්නට දරුවා ඉතා කැමැති ය. එ හෙයින් කිරි හාමිට දරුවා ගන්නට කියා එඬෙර බිරින්දෑ තමා ගේ කට යුත්තකට ගිය දෑ ය. කිරි හාමි කීප වරක් ම දරුවා ගන්නට තැත් කෙළේ ය. එහෙත් දරුවා ඊට ඉඩ නො දෙයි. ඒ බව කී කල, 'එහෙ නම් කොරහේ දිය හලන්නැ' යි කියා, එඬෙර බිරින්දෑ දියට ගිය දෑ ය.

කිරි හාමි දරුවා ඉන්ද දී ම කොරහ ඔසවා-ගෙන ගෙයි පිටි පසට ගියේ ය. ගෙදර කෙල්ල ඒ දැක, 'කුමක් ද මේ කරන්නට යන්නේ?' යි ඇසුවා ය.

'මේ කොරහේ දිය හලන්නට යනවා.'
'දරුවාත් එක්ක ද?'
'නිකම් ඉන්නවා, පණ්ඩිත කම් නො දොඩා.'

මෙ සේ කියා කිරි හාමි සිට-ගෙන ම කොරහ නැමී ය. දරුවා පෙරළී

බිම වැටී මහ හඬින් අඬන්නට වී ය. කෙල්ල දිව ඇවිත් දරුවා වඩා-ගෙන, කිරි හාමිට බැණ බැණ ගියා ය.

'කුමක් වුණා ද, මගේ පුතා අඬන්නේ?' යි දිය කළයත් ගෙන එමින් සිටි මව ඇසුවාය. කෙල්ල කිරි හාමි කළ හපන් කම කීවා ය. කොනකට වී බිම ඉරි අඳිමින් සිටි කිරි හාමි තමා ගේ අතේ වරදක් නැති බව කියන්නට වූයේ ය.

'මට කොරහේ දිය හලන්නට කීවා නො වෙ යැ?'
'ඔව්. ඉතින් ළමයා හලන්නට මා කීවා යැ?'

'නෑ, මා ළමයා හැලුවේ නෑ. දිය පමණ යි, මා හැලුවේ. ඉතින්, ළමයා ගේ පොඩි කමට කළ දේ බලන්න.'
'කුමක් කළා ද?'
'කොරහෙන් වැටුණා.'

මව ගේ කෝපය හොඳට ම ඇවිස්සුණේ ය. දරුවා ද මව ගේ මුහුණ බලබලා තවමත් හඬයි. මව ගේ හිණෙහි වූ දිය කළය සැණෙකින් කිරි හාමි ගේ හිසට පැන, සියක් කැබැලි ව බිම වැටුණේ ය. කළයේ දියෙන් කිරි හාමි සම්පූර්ණයෙන් නැවුණේ ය. මව දරුවා වඩා-ගෙන සිඹ සනසා, ඇඟ පිසිමින් ගියා ය.

බුලත් විටක් කන වේලා යන විට කිරි හාමිට සීතලෙක් දැනුණේ ය. සඟ නම කී මැරෙන දවස ඔහුට වහා මතක් විය. හිස ද පය ද හේ අත ගා බැලී ය. දෙ පළම එක සැටි සීතල ය. 'මා මළා, මා මළා' යන මර හඬ ඇසී ගෙදර සිටි අය වහා දිව ආවෝ ය. ඔවුනට පෙනුණේ, ඇස් පියා, දෑත් බඩ මතට දී, දෙපා එක් කොට-ගෙන, උඩ බලා බිම හොත් කිරි හාමි ය.

එඬේරා එ දා ගෙදර නැත. කිරි හාමි ගේ තොරතුරු දන්නා නමුත්, දුන් පහර නිසා එඬේර බිරින්දෑට භයෙක් උපන්නේ ය. එ හෙයින් අසල ගෙදර සිටි ගෑනුන් දෙන්නා ද කැඳවා ගෙන ඉතා අමාරුයෙන් කිරි හාමි ඔසවා-ගෙන ගොස් කැලෑවේ දමා ආ දෑ ය.